සෞඛ්‍ය අමාත්‍යාංශය

දේශීය වෛද්‍ය අංශය

ආයුර්වේද වෛද්‍ය සභාව

වාර්ෂික වාර්තාව - 2022



පටුන

ආයුර්වේද වෛද්‍ය සභාවේ දැක්ම, මෙහෙවර, පරමාර්ථය හා අභිමතාර්ථ	4
ආයුර්වේද වෛද්‍ය සභාවේ හැදින්වීම හා කාර්යභාරය	5
ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජිකයින් - 2022	6
ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය	7
ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය	
මූල්‍ය සම්පාදනය	8
ප්‍රතිපත්ති සම්පාදනය, විමර්ශනය හා විශේෂ වෛද්‍ය මණ්ඩල	9-10
1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ 55(1) හා 55(2) වගන්ති ප්‍රකාරව පාරම්පරික, ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම	11-14
ආයුර්වේද වෛද්‍ය සභා නිල වෙබ් අඩවිය, වෛද්‍ය ලියාපදිංචිය අලුත් කිරීම, විශේෂිත වැඩ සටහන්	15-16
2022 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණ වලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් පියවර	17
2022 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	18-20
2022 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	21-23
2022 මුදල් ප්‍රවාහ ප්‍රකාශය	24-25
2022 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	26
ආයුර්වේද වෛද්‍ය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව	27-34
සංස්ථාපිත තොරතුරු	35
ස්තූතිය	36

දැක්ම

ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සඳහා ආයුර්වේදය

මෙහෙවර

වෘත්තීය ආචාරධර්මවලට අනුගත වෙමින් උපරිම
සෞඛ්‍ය සේවාවක් සලසමින්
ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය සඳහා
අවශ්‍ය නෛතික පදනම සුරක්ෂිත කිරීම.

පරමාර්ථය

1961 අංක 31 දරණ ආයුර්වේද පනතෙහි
විධිවිධානවලට අනුකූලව ආයුර්වේද ක්ෂේත්‍රයේ
ගුණාත්මක සංවර්ධනය සංස්ථාපනය කිරීමට අවශ්‍ය
දැනුම, කුසලතාවය හා පළපුරුද්ද සහිත
වෘත්තිකයින් වෙත
නෛතික අධිකාරිත්වය පිරිනැමීම
සහ වෘත්තියේ ගරුත්වය සහ ගුණාත්මකභාවය
සුරක්ෂිත කිරීම.

අභිමතාර්ථ -

1. 1961 අංක 31 දරන ආයුර්වේද පනතින් සභාවට පවරා ඇති බලතල බලාත්මක කිරීම.
2. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තීමය නිපුණත්වය නගාලීමට ප්‍රමිති/ නිර්ණායක සකස් කිරීම හා පවත්වාගෙන යාම.
3. ආයුර්වේද වෘත්තිකයන්ගේ චර්යාව විධිමත් ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය ආචාරධර්ම හා ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම.
4. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තීය චර්යාවන් නිර්ණය කිරීම හා පාලනය කිරීම.
5. ආයුර්වේද වෛද්‍ය සභාවේ සම්පත් හා පහසුකම් යාවත්කාලීන කිරීම මඟින් එහි කාර්යසාධනය වැඩි දියුණු කිරීම.

1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාවේ හැඳින්වීම හා කාර්යභාරය

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශය අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලයලත් ආයතනය විය. 1935 අංක 46 දරණ ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥාපනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරණ ස්වදේශීය වෛද්‍ය ආඥාපනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ නැවත ස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යභාරය

(අ). ආයුර්වේදය උගන්වන යම් ආයතනයක් 1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතුද යන්න ඇමතිවරයාට නිර්දේශ කිරීම.

(ආ). ආයුර්වේද වෛද්‍යවරුන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඇ). ආයුර්වේද භෛෂජ්ජකවරුන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඈ). ආයුර්වේද හෙද නිලධාරීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඉ). එසේ ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටුවීම, හා

(ඊ). **1.** ආයුර්වේද වෛද්‍යවරුන්, ආයුර්වේද භෛෂජ්ජකවරුන් හා ආයුර්වේද හෙද නිලධාරීන්ගේ වෘත්තීය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා,

2. ඉහතින් සඳහන් (ආ) සිට (ඉ) දක්වා ඡේදවල සඳහන් කරුණු වලින් යමක් සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.



1961 අංක 31 පනත යටතේ ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාව

1961 අංක 31 දරන ආයුර්වේද පනත හා 1977 අංක 07 දරන සංශෝධන පනත අනුව ආයුර්වේද වෛද්‍ය සභාව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

1) ආයුර්වේද කොමසාරිස් - (සභාපති)

2) දේශීය වෛද්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂ - (නිල බලයෙන්)

3) දේශීය වෛද්‍ය විද්‍යායතනයෙහි ආචාර්යවරුන් අතුරින් තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයින් දෙදෙනකු

4) අනුමත කරනු ලැබූ එක් එක් ආයුර්වේද අධ්‍යාපනික ආයතන වල ආචාර්යවරුන් අතුරින් තෝරා පත්කර ගනු ලැබූ එක් සාමාජිකයකු

5) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍ය වරුන් විසින් ඔවුන් අතුරින් තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයින් තුන්දෙනකු හා

6) ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයින් දස දෙනකුට වැඩි නොවන ගණනක්, ඔවුන් අතර

   (i) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් නොවන තැනැත්තන් අතුරින් තුන්දෙනකුට වැඩිය මෙසේ පත් නොකළ යුතුය.

   (ii) සමස්ථ ලංකා ආයුර්වේද වෛද්‍ය සම්මේලනය විසින් නම් කෙරෙන දස දෙනකුගෙන් යුත් මණ්ඩලයකින් යටත් පිරිසෙන් තුන්දෙනකු එසේ පත් කරනු ලැබිය යුතුය.

   (iii) සමස්ථ ලංකා ආයුර්වේද වෛද්‍ය සම්මේලනයේ සාමාජිකයින් නොවන ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍ය වරුන්ගෙන් යටත් පිරිසෙන් දෙදෙනෙකු එසේ පත් කරනු ලැබිය යුතුය.

2022 වර්ෂයේ 21 වන ආයුර්වේද වෛද්‍ය සභාවේ සභා සාමාජිකයින්

1. ආයුර්වේද කොමසාරිස්, ආචාර්ය. එම්.ඩී.ජේ.අබේගුණවර්ධන මයා - සභාපති
2. අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යායතනය - මහාචාර්ය, ප්‍රියානි ඒ.පරණගම මිය - උප සභාපති
3. පූජ්‍ය බෙංගමුවේ නාලක හිමි - සාමාජික
4. අධ්‍යක්ෂ, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, කේ.පී.ආර්. ප්‍රනාන්දු මහතා මහතා - නිරීක්ෂක
5. වෛද්‍ය ම.හේ.නිමල් කරුණාසිරි මයා - සාමාජික
6. මහාචාර්ය ජෝ.කටී.වෛද්‍ය එස්.එම්.එස්.සමරකෝන් මහතා - සාමාජික
7. මහාචාර්ය ජෝ.කටී. වෛද්‍ය එම්.යූ.ඉසෙඩ්.එන්.ෆර්සානා මිය - සාමාජික
8. තුෂාර සම්පත් පෙරේරා මයා - සාමාජික
9. වෛද්‍ය එච්.බැසිල් රංජිත් ප්‍රනාන්දු මයා - සාමාජික
10. වෛද්‍ය ඒ.ඇම්.හීංනිලමේ මයා - සාමාජික
11. වෛද්‍ය තිළිණ වික්‍රමසිංහ මයා - සාමාජික
12. වෛද්‍ය චමරී වෛද්‍යරත්න මිය - සාමාජික
13. වෛද්‍ය එම්.ඩී.අසංග රංජන මයා (2022.07.12 දක්වා) - සාමාජික
14. වෛද්‍ය ජී.විජේරත්න මයා - සාමාජික
15. එච්.එන්.ආර්.හෙට්ටිආරච්චි මයා - සාමාජික
16. වෛද්‍ය පී.ඩබ්ලිව්.ඩබ්ලිව්.දිසානායක මයා - ලේඛකාධිකාරී

මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභා රැස්වීම් **11** ක් පවත්වා ඇත.

ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය



ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය - 2022

01. මූල්‍ය සම්පාදනය

2022 වර්ෂය වෙනුවෙන් ආයුර්වේද වෛද්‍ය සභාව වෙත රුපියල් ලක්ෂ හැත්තෑ දෙකක **(7,200,000/-)** මුදලක් රජයේ ප්‍රදාන වශයෙන් ලබා දී ඇත.

2022 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාව වෙත විවිධ ක්ෂේත්‍රයන් මඟින් ලැබූ ආදායම රු.**12,704,690.61** ක් වූ අතර මුළු වියදම රු **16,608,652.16** ක් විය. 2022 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙන් ද 2022.12.31 දිනට සභාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක් ශේෂ පත්‍රයෙන් ද ඉදිරිපත් කර ඇත. මීට අමතරව 2022 වර්ෂය තුළ මුදල් ගලා ඒම හා ගලායාම පිළිබඳ තත්ත්වය මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය මඟින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 1.1

වාර්ෂික ආදායම, වියදම හා රජයේ ප්‍රදාන

අයිතමය	2018 රුපියල්	2019 රුපියල්	2020 රුපියල්	2021 රුපියල්	2022 රුපියල්
රජයේ ප්‍රදාන	6,000,000.00	6,000,000.00	6,000,000.00	7,200,000.00	7,200,000.00
උපයාගත් ආදායම	5,996,261.00	9,276,014.50	6,183,476.81	5,633,507.25	12,704,690.61
මුළු ලැබීම්	**11,996,261.00**	**15,276,014.50**	**12,183,476.81**	**12,833,507.25**	**19,904,690.61**

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රජයේ ප්‍රදාන හා අනෙකුත් ආදායම් ප්‍රස්ථාරයේ දැක්වේ.

ප්‍රස්ථාර අංක 1.1



02. ප්‍රතිපත්ති සම්පාදනය

ආයුර්වේද වෛද්‍ය සභාව විසින් ස්ථාවර අනුකමිටු වශයෙන් පහත සඳහන් කමිටු ක්‍රියාත්මක කරනු ලබයි.

I. විභාග පාලක මණ්ඩලය
II. දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව
III. අතිරේක සුදුසුකම් නිර්ණය කිරීමේ අනු කමිටුව

ලියාපදිංචි අපේක්ෂිත පාරම්පරික ආයුර්වේද සහ සිද්ධ අයැදුම්කරුවන් සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය 2021.08.10 දින පවත්වන ලද 21 වන ආයුර්වේද වෛද්‍ය සභාවේ 11 වන රැස්වීමේ දී ගන්නා ලද තීරණය අනුව ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරන ලදී. ඒ අනුව 2022 මාර්තු මස 12 හා 13 වන දෙදින කොළඹ 05, ලුම්බිනි විද්‍යාලයේ දී පවත්වන ලද ලිඛිත පරීක්ෂණයේ අවසාන ප්‍රතිඵල 2022.10.10 වන දින ආයුර්වේද වෛද්‍ය සභාව වෙත ලබා දී ඇත.

ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවූ සංඛ්‍යාව	419
ලිඛිත පරීක්ෂණය සඳහා පැමිණි සංඛ්‍යාව	291
ලිඛිත පරීක්ෂණය සඳහා නොපැමිණි සංඛ්‍යාව	128

ආයුර්වේද/සිද්ධ	සර්වාංග	විශේෂ	එකතුව	මුළු එකතුව
සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - ආයුර්වේද සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - සිද්ධ	31 03	60 04	91 07	98
ඌණ සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - ආයුර්වේද ඌණ සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - සිද්ධ	15 05	78 04	93 09	102
අසමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - ආයුර්වේද අසමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - සිද්ධ	67 02	18 02	85 04	89
විභාග අක්‍රමිකතා හේතුවෙන් ප්‍රතිඵල අත්හිටුවා ඇති අයැදුම්කරුවන් සංඛ්‍යාව - ආයුර්වේද	02	-	02	02
එකතුව	**125**	**166**	**291**	**291**
නොපැමිණි අයැදුම්කරුවන් සංඛ්‍යාව - ආයුර්වේද නොපැමිණි අයැදුම්කරුවන් සංඛ්‍යාව - සිද්ධ	84 02	40 02	124 04	128
මුළු එකතුව	**211**	**208**	**419**	**419**

ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් නිර්ණය කිරීමේ අනුකමිටුව

1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ 62 වන වගන්තිය අනුව ලියාපදිංචි යම් ආයුර්වේද වෛද්‍යවරයෙකු හට තම ලියාපදිංචියෙන් පසුව ලබා ගන්නා වෘත්තියට අදාළ යම් සුදුසුකමක් අතිරේක සුදුසුකමක් ලෙස සභාව පිළිගත් විට එය නාම ලේඛනයට ඇතුළත් කිරීමේ බලය හිමිවේ. ඒ අනුව එම අතිරේක සුදුසුකම සඳහා සභාව විසින් නිකුත් කරනු ලබන සහතිකයක් දැරීමටත් සිය නම සමඟ ප්‍රදර්ශනය කිරීමටත් එම අතිරේක සුදුසුකම වෘත්තිය කටයුතු සඳහා භාවිතා කිරීමටත් නෛතික හිමිකම තහවුරු කරනු ලබයි. ආයුර්වේද වෛද්‍ය සභා තීරණය පරිදි මෙම වගන්තියේ විධිවිධාන අනුව අතිරේක සුදුසුකම් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට ඒ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුම්වත් කර තිබේ. 2022 වර්ෂයේ දී ලියාපදිංචි වෛද්‍යවරුන් **09** දෙනෙකුගේ අතිරේක සුදුසුකම් සභාව විසින් අනුමත කර ඇත.

වගු අංක 2.1

අයිතමය	2018	2019	2020	2021	2022
අතිරේක සුදුසුකම් ඇතුළත් කොට සහතික නිකුත් කර ඇති සංඛ්‍යාව	11	09	08	21	09

03. විමර්ශන කටයුතු

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තිය විෂමාචාර මෙන්ම ලියාපදිංචි නොවී ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිලි සොයා බලා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ මහජන පැමිණිලි විමර්ශන ඒකකයක් පිහිටුවා ඇත. එම වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා, වෘත්තිය විෂමාචාර, ආයුර්වේද ආචාරධර්ම වලට පටහැනිව ක්‍රියා කිරීම ආදිය විමර්ශනය කිරීම මෙහි මූලික අරමුණවේ. සභාවේ මෙම කාර්යය පුවත්පත් දැන්වීම් පැමිණිලි හා මහජන පැමිණිලි වශයෙන් වෙන්කොට විමර්ශනය සඳහා යොදා ගැනේ. 2021 වර්ෂයේ දී ලියාපදිංචි වෛද්‍යවරුන් 50 දෙනෙකු සම්බන්ධව ලැබී තිබුණු පැමිණිලි 45 ක් විමර්ශනය කර අවසන් කර ඇති අතර 2022 වර්ෂයේ ලැබුණු පැමිණිලි 25 ක් ලැබී ඇති අතර ඉන් 13 ක විමර්ශන කටයුතු අවසන් කර ඇත.

වගු අංක 3.1

අයිතමය	2018	2019	2020	2021	2022
විමර්ශනය සඳහා ලැබී ඇති සංඛ්‍යාව	13	59	100	50	25
විමර්ශනය කර ඇති පැමිණිලි සංඛ්‍යාව	12	49	87	45	13

04. විශේෂ වෛද්‍ය මණ්ඩලය

රජයේ හා පෞද්ගලික ආයතන වල සේවයේ නියුතු සේවකයින් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxvi වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන වෛද්‍ය මණ්ඩලයට සමගාමීව ආයුර්වේද වෛද්‍ය සහතික සම්බන්ධයෙන් අදාළ විශේෂ වෛද්‍ය මණ්ඩල පවත්වනු ලැබේ. ඒ පිළිබඳව සොයා බැලීම සඳහා ඒ ආයතන මඟින් වෛද්‍ය සභාවට පොදු 142 ආකෘති පත්‍රය සම්පූර්ණ කර එවනු ලැබේ. 2021 වර්ෂයේ දී විශේෂ වෛද්‍ය මණ්ඩල **05** ක් වෛද්‍ය සභාව මඟින් පවත්වා ඇත.

වගු අංක 4.1

අයිතමය	2018	2019	2020	2021	2022
පවත්වා ඇති විශේෂ වෛද්‍ය මණ්ඩල සංඛ්‍යාව	04	05	03	05	01

2022 වර්ෂයේ දී විශේෂ වෛද්‍ය මණ්ඩල වෙත යොමු කිරීම සඳහා රජයේ ආයතන, දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ මඟින් යොමු කරන ලද රෝගීන් 11 දෙනෙකු සඳහා පොදු 142 ආකෘතිය අනුව වෛද්‍ය මණ්ඩල වාර්තා ලබාදී ඇත.

වගු අංක 4.2

විශේෂ වෛද්‍ය මණ්ඩලය පැවැත් වූ දිනය	කැඳවන ලද රෝගීන් සංඛ්‍යාව	විශේෂ වෛද්‍ය මණ්ඩලය සඳහා පෙනීසිටි රොගීන් සංඛ්‍යාව
2022.03.23	**12**	**11**
එකතුව	**12**	**11**

විශේෂ වෛද්‍ය මණ්ඩල පැවත්වීම 2022.01.11 දින සභාවේ තීරණය පරිදි 2022.02.14 දින සිට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මඟින් සිදු කිරීම සඳහා ආයුර්වේද කොමසාරිස් වෙත යොමු කර ඇත.

05. 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 55(1) හා 55(2) වගන්ති යටතේ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

ආයුර්වේද වෛද්‍ය සභාව පහත සඳහන් මූලික ප්‍රතිපත්ති මත වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය සිදු කරයි.

1. ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්, අභිඥානපත්‍රධාරීන් සහ රජය පිළිගත් සහතික පත්‍රධාරීන් සුදුසුකම් අනුව ලියාපදිංචි කිරීම.
2. ආයුර්වේද වෛද්‍ය සභාව සම්මත කරනු ලැබූ ව්‍යවස්ථාව අනුව වාචික පරීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ අනුව සුදුසුකම්ලත් පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

වාචික පරීක්ෂණයේ දී අපේක්ෂකයා ලබා ගන්නා ලකුණු ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කිරීමක් සිදුකරන අතර පරීක්ෂණයෙන් අසමත් වන අයැදුම්කරුවන් ඔවුන්ගේ ලකුණු ප්‍රමාණය අනුව මාස තුනක, මාස හයක හා වසරක් ආදී වශයෙන් ඇගැයුම් කාලයකට යටත් කොට නැවත වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

වගු අංක 5.1

2018 සිට 2022 දක්වා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය වරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මඟින් පවත්වන ලද වාචික පරීක්ෂණ මණ්ඩල පිළිබඳ සටහන

අයිතමය	2018	2019	2020	2021	2022
වාර්ෂිකව පවත්වන ලද වාචික පරීක්ෂණ මණ්ඩල සංඛ්‍යාව	**27**	**34**	**03**	**24**	**27**
වාර්ෂිකව වාචික පරීක්ෂණය සඳහා කැඳවන ලද අයැදුම්කරුවන් සංඛ්‍යාව	**302**	**433**	**37**	**338**	**422**
වාර්ෂිකව වාචික පරීක්ෂණය සඳහා සහභාගී වූ අයැදුම්කරුවන් සංඛ්‍යාව	**235**	**337**	**30**	**281**	**329**
වාචික පරීක්ෂණ මඟින් ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන් සංඛ්‍යාව	**49**	**94**	**10**	**180**	**136**
සහභාගී වූ අයැදුම්කරුවන්ගෙන් සමත් වූ ප්‍රතිශතය	**20.85%**	**27.89%**	**33.33%**	**64.06%**	**41.33%**

ප්‍රස්ථාර අංක 5.1



වගු අංක 5.2

2022 වර්ෂයේ පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මඟින් පවත්වන ලද වාචික පරීක්ෂණ මණ්ඩල පිළිබඳ පළාත් සටහන

පළාත	වාචික පරීක්ෂණ මණ්ඩල සංඛ්‍යාව	කැඳවූ සංඛ්‍යාව	පැමිණි සංඛ්‍යාව	සමත් සංඛ්‍යාව
මධ්‍යම	3	46	37	10
දකුණ	3	49	38	16
ඌව	0	00	0	0
බස්නාහිර	8	119	77	25
උතුර	2	19	17	9
නැගෙනහිර	4	53	45	20
වයඹ	3	59	52	34
සබරගමුව	3	60	51	17
උතුරු මැද	1	17	12	5
එකතුව	27	422	329	136

ප්‍රස්ථාර අංක 5.2





2022 වර්ෂය අවසන් වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව **26650** කි. මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍යවරුන් **467** දෙනෙකු පහත සඳහන් අංශ අනුව ලියාපදිංචි කර ඇත.

වගු අංක 5.3

2018 සිට 2022 දක්වා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂිකව ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව

අයිතමය	2018	2019	2020	2021	2022
සාමාන්‍ය (සර්වාංග)					
උපාධිධාරීන්	**274**	**246**	**250**	**32**	**283**
ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- කොළඹ විශ්වවිද්‍යාලය	**111**	**107**	**101**	**11**	**146**
ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	**94**	**80**	**75**	**04**	**65**
යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- කොළඹ විශ්වවිද්‍යාලය	**27**	**15**	**47**	**03**	**35**
සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- යාපනය විශ්වවිද්‍යාලය / නැගෙනහිර විශ්වවිද්‍යාලය	**42**	**43**	**27**	**13**	**37**
ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- ඉන්දියාව	**-**	**01**	**-**	**01**	**-**
ඩිප්ලෝමාධාරීන්	**27**	**13**	**01**	**18**	**18**
ආයුර්වේද ශාස්ත්‍රී	**27**	**10**	**01**	**10**	**05**
යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත්	**-**	**03**	**-**	**08**	**13**
පාරම්පරික - සර්වාංග	**11**	**19**	**07**	**27**	**47**
පාරම්පරික	**11**	**19**	**07**	**27**	**47**
පාරම්පරික - විශේෂ	**44**	**74**	**20**	**45**	**119**

සර්ප විෂ	**10**	**20**	**06**	**04**	**25**
කැඩුම් බිඳුම්	**27**	**43**	**13**	**25**	**64**
අක්ෂි රෝග	**01**	**-**	**-**	**05**	**04**
චර්ම රෝග	**-**	**04**	**-**	**04**	**10**
ගෙඩිවණ	**01**	**02**	**01**	**01**	**05**
ජලභීතිකා	**-**	**-**	**-**	**01**	**-**
දැවුම් පිළිස්සුම්	**-**	**02**	**-**	**02**	**04**
විදුම් පිළිස්සුම්	**-**	**02**	**-**	**-**	**01**
මානසික	**05**	**01**	**-**	**03**	**06**
හස්ති වෙදකම	**-**	**-**	**-**	**-**	**-**
මුළු එකතුව (සර්වාංග / විශේෂ)	**356**	**352**	**278**	**122**	**467**

වගු අංක 5.4

2022-12-31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව

අයිතමය	2022-12-31 දිනට මුළු වෛද්‍යවරු සංඛ්‍යාව
(1) මුළු ලියාපදංචි සංඛ්‍යාව සාමාන්‍ය (සර්වාංග) **A+B+C**	**16351**
A. උපාධිධාරීන්	**3689**
ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය	**1816**
ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	**855**
යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය	**489**
සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - යාපනය විශ්වවිද්‍යාලය / නැගෙනහිර විශ්වවිද්‍යාලය	**518**
ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - ඉන්දියාව	**11**
B. ඩිප්ලෝමාධාරීන්	**5761**
එල්.ඒ.එම්.එස්. - කල්කටා	**95**
එෆ්.එම්.බී.එස්. - අහලමාබාද්	**04**
එම්.එල්.එම් - ඉන්දියා	**01**
ඩී.අයි.එම්.එස්. - දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ	**584**
ඩී.ඒ.එම්.එස්. - දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ	**1299**
ඩී.එස්.ඒ.සී. - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය	**1189**
ඩී.ඒ.එස්.සී. - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය	**157**
එල්.ඒ.එම්. - යාපනය සිද්ධ විද්‍යාලය	**91**
සිද්ධායුර්වේදඥලාභීන් - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය	**635**
ආයුර්වේද ශාස්ත්‍රී	**1467**
යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත්	**239**
C. පාරම්පරික - සර්වාංග	**6901**
පාරම්පරික	**6901**

(2) මුළු ලියාපදිංචි සංඛ්‍යාව පාරම්පරික - විශේෂ	**10299**
සර්ප විෂ	**4049**
කැඩුම් බිඳුම්	**2839**
අක්ෂි රෝග	**750**
චර්ම රෝග	**375**
ගෙඩිවණ	**731**
ජලභීතිකා	**231**
දැවුම් පිළිස්සුම්	**96**
මානසික	**205**
විදුම් පිළිස්සුම්	**11**
වෙනත්	**1012**
මුළු එකතුව (සර්වාංග / විශේෂ වෛද්‍යවරුන්) – (1)+(2)	**26650**
මියගොස් ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව - 2022.12.31 දිනට	**3827**

06. ආයුර්වේද වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය

ආයුර්වේද වෛද්‍යවරුන් සම්බන්ධව රාජ්‍ය අංශයේ ව්‍යාපාරික අංශයේ හා ප්‍රජාවගේ විශේෂ අවධානය යොමු වී ඇති මෙම කාලසීමාවේ එම කටයුතු පහසු කිරීම සඳහා සහ ආයුර්වේද ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා හා ලියාපදිංචි/ලියාපදිංචි අපේක්ෂිත ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අවශ්‍යවන මාර්ගෝපදේශ, නීති රෙගුලාසි හා අනෙකුත් නෛතික තත්ත්වයන් රාජ්‍ය අංශයේ, ව්‍යාපාරික අංශයේ හා ප්‍රජාවගේ අවශ්‍යතාවය අනුව එළිදැක්වීම මෙම වෙබ් අඩවියෙන් අපේක්ෂා කෙරේ. ලියාපදිංචි සියලු වෛද්‍යවරුන්ගේ තොරතුරු www.amc.ayurveda.gov.lk නිල වෙබ් අඩවිය හරහා අන්තර්ජාලයට එක් කර ඇත. 2009 වර්ෂයේ වෛද්‍ය සභාවේ අනුමැතිය මත මෙම වෙබ් අඩවිය 2010-09-07 වන දින ආරම්භ කරන ලදී.



www.ayurvedicmedicoun.gov.lk

07. ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම

අංක **1884/36** දරන ගැසට් නිවේදනය අනුව ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා වසර 05 ක් සම්පූර්ණ වී ඇති වෛද්‍යවරුන් තම ලියාපදිංචිය අලුත් කිරීම සිදු කළ යුතුය. නියමිත දිනට ලියාපදිංචිය අලුත් කර නොමැති වෛද්‍යවරුන් වාර්ෂිකව අයකරනු ලබන ප්‍රමාද ගාස්තුවකට යටත් වනු ඇත.

වගු අංක 7.1

අයිතමය		2017	2018	2019	2020	2021	2022
ලියාපදිංචිය අළුත් කර ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව	සර්වාංග	439	313	607	697	360	542
	විශේෂ	127	161	205	554	222	195

ප්‍රස්ථාර අංක 7.1



08. ආයුර්වේද වෛද්‍ය සභාවේ මානව සම්පත්

ආයුර්වේද වෛද්‍ය සභාවේ අනුමත කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	2022-12-31 දිනට සේවයේ නියතු කාර්ය මණ්ඩලය
ලේඛකාධිකාරි (කොන්ත්‍රාත් පදනම)	**01**	**01**
කළමනාකරණ සහකාර	**11**	**11**
ලේඛන භාරකරු	**01**	**00**
කාර්යාල කාර්ය සහයක	**01**	**01**
කම්කරු	**02**	**01**
එකතුව	**16**	**14**

09. 2022 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණවලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් කටයුතු

09.1. රජයේ හා පෞද්ගලික ආයතනවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ලබා දෙනු ලැබූ වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදුකිරීම.

අයිතමය	2018	2019	2020	2021	2022
වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදු කළ සංඛ්‍යාව	**738**	**627**	**430**	**512**	**353**

එක් එක් රාජ්‍ය ආයතනවල විගණන විමර්ශන වලින් සපයා ඇති දත්ත අනුව සාවද්‍ය වෛද්‍ය සහතික නිකුත් කරන සැක සහිත වෛද්‍යවරුන් වෙත දින 14 ක් ඇතුළත ආයුර්වේද වෛද්‍ය සභාවට පැමිණ කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපි යොමු කරනු ලැබේ. ඒ සඳහා ප්‍රතිචාර නොදැක්වූ වෛද්‍යවරුන් විසින් නිකුත් කරන වෛද්‍ය සහතික පිළිනොගැනීමට කටයුතු කර ඒ බව අදාළ ආයතන දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබේ. එමඟින් සාවද්‍ය ලෙස නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික අවම කර ගැනීමට හැකි වී ඇත.

වෛද්‍ය සහතික තහවුරු කිරීම් සඳහා බොහෝ අවස්ථාවල ඉතා දුර බැහැර ප්‍රදේශවල සිට රෝගීන් ද මෙම තහවුරු කර ගැනීම සඳහා නවින්න ආයුර්වේද වෛද්‍ය සභාව වෙත පැමිණෙන බවත් එමඟින් ඔවුන් බොහෝ අපහසුතාවලට පත්වන එබැවින් 2022.09.06 දින ආයුර්වේද වෛද්‍ය සභාවේ තීරණය පරිදි **2022.10.01 දින සිට විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික හැර** අනෙකුත් සියළුම වෛද්‍ය සහතික සහතික කිරීම පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් හරහා පළාත් ආයුර්වේද රෝහල් අධ්‍යක්ෂවරුන් වෙත හා දිස්ත්‍රික් මූලික රොහල් වල කාර්යාභාර වෛද්‍යවරුන් වෙත පැවරීම සිදු කරන ලදී.

09.2. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම.

අයිතමය	2018	2019	2020	2021	2022
ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම	**490**	**641**	**405**	**105**	**571**

09.3. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන නිල ලාංඡන නිකුත් කිරීම.

අයිතමය	2018	2019	2020	2021	2022
වාහන නිල ලාංඡන නිකුත් කිරීම.	**126**	**122**	**107**	**78**	**106**

09.4. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම.

අයිතමය	2018	2019	2020	2021	2022
නිකුත් කළ වෛද්‍ය සහතික පොත් සංඛ්‍යාව	**1398**	**1584**	**845**	**821**	**1544**

ඉහත කරුණු අනුව ආයුර්වේද වෛද්‍ය සභාව 2022 වර්ෂය තුළ එහි පරමාර්ථ ඉටුවන අයුරින් කටයුතු කර ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ආයුර්වේද වෛද්‍ය සභාවේ කටයුතු ඉටු කිරීමට නොහැකි වූ කාර්යයන් 2023 වර්ෂයේ දී ඉටු කර ගැනීමට හැකි ලෙස මූලික කටයුතු ආරම්භ කර ඇති බවත් වැඩි දුරටත් සඳහන් කරමි.

ආචාර්ය එම්.ඩී.ජේ.අබේගුණවර්ධන
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති
ආයුර්වේද කොමසාරිස්
ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී,
2022.02. 14

ආයුර්වේද වෛද්‍ය සභාව
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

විස්තරය	2021.12.31 රුපියල්		2022.12.31 රුපියල්
ආදායම	(සංශෝධන)		
01. රජයේ ප්‍රදාන	7,200,000.00		7,200,000.00
02. මෙහෙයුම් ආදායම් - **(සටහන 01)**	5,175,498.00		12,363,425.00
03. මූල්‍ය ආදායම් - **(සටහන 02)**	293,749.25		317,905.61
04. විවිධ ආදායම - **(සටහන 03)**	164,260.00		23,360.00
05. මුළු ආදායම - **(01+02+03+04)**	**12,833,507.25**		**19,904,690.61**
වියදම			
06. මෙහෙයුම් වියදම් - **(සටහන 04)**	2,486,408.60		4,420,509.82
07. ආයතන හා පරිපාලන වියදම් - **(සටහන 05)**	10,117,217.61		12,053,240.95
08. වෙනත් වියදම් - **(සටහන 06)**	125,023.00		135,777.00
09. මුළු වියදම - **(06+07+08)**	**12,728,649.21**		**16,609,527.77**
වාර්ෂික ඌණතාවය / අතිරික්තය - (05-09)	**104,858.04**		**3,295,162.84**

ඉහත සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශණය රජයේ ගිණුම් කරන ප්‍රමිතයන්ට අනුව නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.

සකස් කළේ -
ප්‍රභාත් ගුණසේකර
මූල්‍ය සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

පරීක්ෂා කළේ -
ඒ.එම්.එම්.කේ.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ආයුර්වේද දෙපාර්තමේන්තුව

වෛද්‍ය එච්.බී.කේ.අජිත් කුමාර
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභාව

ආචාර්ය එම්.බී.ජේ.අබේගුණවර්ධන
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස්

සටහන - 01 - මෙහෙයුම් ආදායම්

විස්තරය	2021.12.31		2022.12.31
	රුපියල්		රුපියල්
අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීමේ ආදායම	96,000.00		31,500.00
ලියාපදිංචි අයැදුම්පත් නිකුත් කිරීමේ ආදායම	1,504,250.00		1,983,500.00
චරිත සහතික	-		98,000.00
ලිඛිත පරීක්ෂණ ගාස්තු	-		1,468,150.00
වෛද්‍ය සහතික සහිතක කිරීමේ ආදායම	143,500.00		102,500.00
සහතික පිටපත් නිකුත් කිරීමේ ආදායම	117,000.00		222,000.00
නම් වෙනස් කිරීමේ ආදායම	33,000.00		81,000.00
වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීමේ ආදායම	328,400.00		617,600.00
වාහන ලාංඡන නිකුත් කිරීමේ ආදායම	225,600.00		318,000.00
හැදුනුම්පත් නිකුත් කිරීමේ ආදායම	197,100.00		1,155,500.00
සම්මුඛ පරීක්ෂණ ගාස්තු ආදායම	446,650.00		1,042,100.00
නාමලේඛන පිටපත් ගාස්තු	375.00		11,025.00
තැපැල් ගාස්තු ආදායම	28,673.00		121,000.00
ලියාපදිංචි අංකය තහවුරු කිරීමේ ආදායම	4,000.00		9,500.00
ලියාපදිංචි ගාස්තු ආදායම	793,500.00		3,195,000.00
ලියාපදිංචිය අළුත් කිරීමේ ආදායම	895,050.00		1,628,600.00
විෂය නිර්දේශ නිකුත් කිරීමේ ආදායම	84,900.00		94,200.00
විශේෂ වෛද්‍ය මණ්ඩල ආදායම්	269,000.00		119,000.00
සත්‍ය පිටපත් බවට සහතික කිරීමේ ආදායම	8,500.00		65,250.00
	5,175,498.00		**12,363,425.00**

සටහන - 02 - මූල්‍ය ආදායම්

විස්තරය	2021.12.31		2022.12.31
	රුපියල්		රුපියල්
පාරිතෝෂික දීමනා ආයෝජන පොලී ආදායම	212,736.04		229,357.98
කාර්ය මණ්ඩල ණය පොළී ආදායම	81,013.21		88,547.63
	293,749.25		**317,905.61**

සටහන - 03 - විවිධ ආදායම

විස්තරය	2021.12.31		2022.12.31
	රුපියල්		රුපියල්
විගණන ගාස්තු අධිවෙන් කිරීම	155,460.00		-
විවිධ ආදායම්	8,800.00		23,360.00
	164,260.00		**23,360.00**

සටහන - 04 - මෙහෙයුම් වියදම්

විස්තරය	2021.12.31		2022.12.31
	රුපියල්		රුපියල්
පුවත්පත් දැන්වීම් ගාස්තු	266,058.00		-
ආයුර්වේද වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු	614,200.00		1,024,400.00
අනු කමිටු දීමනා	108,000.00		91,200.00
සංග්‍රහ වියදම්	125,447.48		218,368.60
කුළි රථ හා ඉන්ධන ගාස්තු	106,867.33		280,856.00
හැදුනුම්පත් සකස් කිරීමේ ගාස්තු	14,700.00		93,620.00

සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු	312,000.00		368,450.00
තැපැල් ගාස්තු	184,725.00		336,390.00
මුද්‍රණ ගාස්තු	282,899.40		467,031.60
ලිපිද්‍රව්‍ය වියදම්	371,301.39		750,254.37
ගමන් වියදම්	94,410.00		101,113.00
ලිඛිත පරීක්ෂණ ගාස්තු	5,800.00		681,586.25
වාහන අළුත්වැඩියා වියදම්	-		7,240.00
	2,486,408.60		**4,420,509.82**

සටහන - 05 - ආයතන හා පරිපාලන වියදම්

විස්තරය	**2021.12.31**		**2022.12.31**
	රුපියල්		**රුපියල්**
කාර්ය මණ්ඩල වැටුප්	6,392,352.92		7,385,211.99
කාර්ය මණ්ඩල දීමනා	264,400.00		706,800.00
සභාපති දීමනාව	-		75,000.00
ලේඛකාධිකාරී දීමනා	484,680.00		597,750.00
ගණකාධිකාරී දීමනා	120,000.00		120,000.00
අතිකාල දීමනා ගාස්තු	144,697.17		109,737.28
සේවක අර්ථ සාධක අරමුදල් ගාස්තු	955,136.50		990,093.25
සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල් ගාස්තු	191,027.30		198,018.65
වාර්ෂික පාරිතෝෂික දීමනා ගාස්තු	145,030.00		274,510.00
කාර්යාල උපකරණ අළුත්වැඩියා ගාස්තු	152,047.50		290,725.84
සනීපාරක්ෂක සේවා ගාස්තු	224,394.41		229,016.41
දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු	-		27,150.00
දුම්රිය බලපත්‍ර ගාස්තු	-		2,000.00
පුවත්පත් ගාස්තු	25,780.00		12,020.00
දුරකතන වියදම්	77,183.36		106,243.01
රක්ෂණ ගාස්තු	7,982.70		7,496.33
වාර්ෂික විගණන ගාස්තු	321,000.00		335,000.00
ජල ගාස්තු	16,435.00		11,917.00
කාර්යාල උපකරණ වාර්ෂික ක්ෂය ගිණුම	363,719.62		295,801.78
වාහන වාර්ෂික ක්ෂය ගිණුම	79,791.93		62,237.71
විදුලි ගාස්තු	151,559.20		216,511.70
	10,117,217.61		**12,053,240.95**

සටහන - 06 - වෙනත් වියදම්

විස්තරය	**2021.12.31**		**2022.12.31**
	රුපියල්		**රුපියල්**
විවිධ වියදම්	125,023.00		135,777.00
	125,023.00		**135,777.00**

සටහන 07 - ප්‍රකාශිත අතිරික්තය සංශෝධනය

2021 වර්ෂයේ ප්‍රකාශිත අතිරික්තය	**115,858.04**
2021 වර්ෂයේ විගණන ගාස්තු ඌණ වෙන්කිරීම	(11,000.00)
2021 වර්ෂයේ සංශෝධිත අතිරික්තය	**104,858.04**

ආයුර්වේද වෛද්‍ය සභාව
2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

විස්තරය	2021.12.31 රුපියල් (සංශෝධන)		2022.12.31 රුපියල්	
වත්කම්				
ජංගම වත්කම්				
මුදල් ශේෂය	3,117,410.05		6,900,348.70	
සේවක ණය අත්තිකාරම්	2,093,000.00		2,196,000.00	
අත්තිකාරම් ගෙවීම්	-		96,485.00	
වෛද්‍ය සහතික පොත් තොග ගිණුම	523,992.00		336,318.80	
ලිපිද්‍රව්‍ය තොගය	393,822.94		384,279.87	
තැපැල් මුද්දර තොග ගිණුම	16,565.00		55,175.00	
ඉදිරි වර්ෂය සඳහා ගෙවීම් - **සටහන 01**	44,456.23		44,354.44	
		6,189,246.22		10,012,961.81
ජංගම නොවන වත්කම්				
දේපල, පිරියත හා උපකරණ (ගත්මිල)	6,979,238.17		6,979,238.17	
සමුච්චිත ක්ෂය ගිණුම	(5,237,242.09)		(5,533,043.87)	
දේපල, පිරියත හා උපකරණ (ශුද්ධ අගය)		1,741,996.08		1,446,194.30
වාහන ගිණුම	764,280.00		764,280.00	
වාහන ක්ෂය වෙන්කිරීමේ ගිණුම	(481,381.33)		(543,619.04)	
වාහන ක්ෂය (ශුද්ධ අගය)		282,898.67		220,660.96
පාරිතෝෂික දීමනා ආයෝජන		4,170,145.00		4,444,655.00
මුළු වත්කම්		**12,384,285.97**		**16,124,472.07**
බැරකම්				
ජංගම බැරකම්				
විගණන ගාස්තු වෙන්කිරීමේ ගිණුම	321,000.00		335,000.00	
ඉදිරි වර්ෂය සඳහා ලැබීම් - තැපැල් ගාස්තු	400.00		200.00	
ඉදිරි වර්ෂය සඳහා ලැබීම් -වාහන ලාංඡන ගාස්තු	6,000.00		6,000.00	
ගෙවිය යුතු ලිඛිත පරීක්ෂණ ගාස්තු	-		5,500.00	
ගෙවිය යුතු සනීපාරක්ෂක සේවා ගාස්තු	-		1,220.44	
උපචිත ගෙවීම් - **සටහන 02**	60,820.56		141,063.38	

ඉදිරි වර්ෂය සඳහා ලැබීම් - **සටහන 03**	1,660,450.00		1,730,200.00	
		2,048,670.56		2,219,183.82
ජංගම නොවන බැරකම්				
පාරිතෝෂික දීමනා වෙන්කිරීමේ ගිණුම		4,170,145.00		4,444,655.00
මුළු බැරකම්		**6,218,815.56**		**6,663,838.82**
ශුද්ධ වත්කම්		**6,165,470.41**		**9,460,633.25**
ශුද්ධ වත්කම් / ස්කන්ධය				
ප්‍රාග්ධනය හා සංචිතය		6,060,612.37		6,165,470.41
අඩු කළා / එකතු කළා				
කාලච්ඡේදය සඳහා අතිරික්තය / ඌණතාවය	**(සටහන 04)**	104,858.04		3,295,162.84
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		**6,165,470.41**		**9,460,633.25**

සටහන 01 - ඉදිරි වර්ෂය සඳහා ගෙවීම්	**2021.12.31**	**2022.12.31**
ඉදිරි වර්ෂය සඳහා රක්ෂණ ගාස්තු	2,606.23	12,966.98
ඉදිරි වර්ෂය සඳහා කාර්යාල උපකරණ අළුත්වැඩියා ගාස්තු	41,850.00	31,387.46
	44,456.23	**44,354.44**

සටහන 02 - උපචිත ගෙවීම්	**2021.12.31**	**2022.12.31**
උපචිත දුරකතන වියදම්	743.28	7,785.78
උපචිත අතිකාල වියදම්	13,383.96	-
උපචිත ගණකාධිකාරී දීමනා	-	40,000.00
උපචිත විදුලි ගාස්තු	12,393.32	12,590.00
උපචිත ගමන් ගාස්තු	700.00	-
උපචිත වෛද්‍ය සහා රැස්වීම් ගාස්තු	-	20,800.00
උපචිත සනීපාරක්ෂක සේවා ගාස්තු	-	23,487.60
උපචිත කාර්ය මණ්ඩල දීමනා	33,600.00	36,400.00
	60,820.56	**141,063.38**

සටහන 03 - ඉදිරි වර්ෂය සඳහා ලැබීම්	**2021.12.31**	**2022.12.31**
ඉදිරි වර්ෂය සඳහා හැදුනුම්පත් ගාස්තු ගාස්තු ලැබීම්	166,200.00	169,700.00
ඉදිරි වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තු	15,000.00	15,000.00
ඉදිරි වර්ෂය සඳහා ලිඛිත පරීක්ෂණ ගාස්තු	1,166,150.00	1,038,000.00
ඉදිරි වර්ෂය සඳහා විශේෂ වෛද්‍ය මණ්ඩල ගාස්තු	42,000.00	-
ඉදිරි වර්ෂය සඳහා සම්මුඛ පරීක්ෂණ ගාස්තු	268,100.00	507,500.00
ඉදිරි වර්ෂය සඳහා සහතික පිටපත් ගාස්තු	3,000.00	-
	1,660,450.00	**1,730,200.00**

සටහන 04 - ප්‍රකාශිත අතිරිත්තය සංශෝධනය

2021 වර්ෂයේ ප්‍රකාශිත අතිරිත්තය	**115,858.04**
2021 වර්ෂයේ විගණන ගාස්තු ඌණ වෙන්කිරීම	(11,000.00)
2021 වර්ෂයේ සංශෝධිත අතිරික්තය	**104,858.04**

ඉහත සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශණය රජයේ ගිණුම් කරන ප්‍රමිතයන්ට අනුව නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.

සකස් කළේ -
ප්‍රභාත් ගුණසේකර
මූල්‍ය සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

පරීක්ෂා කළේ -
ඒ.එම්.එම්.කේ.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ආයුර්වේද දෙපාර්තමේන්තුව

වෛද්‍ය ඒච්.බී.කේ.අජිත් කුමාර
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභාව

ආචාර්ය එම්.බී.ජේ.අබේගුණවර්ධන
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස්



ආයුර්වේද වෛද්‍ය සභාව
2022.12.31 දින දිනෙන් අවසන් වර්ෂය සඳහා
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය



අයිතමය	2021 වර්ෂය (සංශෝධිත)			2022 වර්ෂය		
	අඩුවීම	වැඩිවීම		අඩුවීම	වැඩිවීම	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ආදායම						
පොලී ආදායමට පෙර අතිරික්තය			104,858.04			3,295,162.84
මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයන් ගැලපීම						
කාර්ය මණ්ඩල ණය පොළිය	81,013.21			88,547.63		
පාරිතෝෂික ආයෝජන පොළිය	212,736.04	-		229,357.98		
වාහන ක්ෂය		79,791.93			62,237.71	
වාර්ෂික ක්ෂය		363,719.62			295,801.78	
වාර්ෂික පාරිතෝෂික දීමනා ගාස්තු		118,030.00			274,510.00	
	293,749.25	**561,541.55**	**267,792.30**	**317,905.61**	**632,549.49**	**314,643.88**
මෙහෙයුම් අතිරික්තය			372,650.34			3,609,806.72
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස් වීම						
සේවක ණය අත්තිකාරම්	67,500.00			103,000.00		
අත්තිකාරම් ගෙවීම් (රජයේ කර්මාන්ත ශාලාව)				96,485.00		
ලිපිද්‍රව්‍ය තොගය	113,502.05				9,543.07	
තැපැල් මුද්දර තොග ගිණුම		9,725.00		38,610.00		
වෛද්‍ය සහතික පොත් තොග ගිණුම	446,808.00				187,673.20	
උපචිත විගණන ගාස්තු	435,060.00				14,000.00	
උපචිත දුරකතන ගාස්තු	5,833.90				7,042.50	
ගෙවිය යුතු ලිඛිත පරීක්ෂණ ගාස්තු					5,500.00	
ගෙවිය යුතු සනීපාරක්ෂක සේවා ගාස්තු					1,220.44	
ඉදිරි වර්ෂය සඳහා රක්ෂණ ගාස්තු		164.01		10,360.75		
ඉදිරි වර්ෂය සඳහා කාර්යාල උපකරණ අළුත්වැඩියා ගාස්තු	10,378.50				10,462.54	
ඉදිරි වර්ෂය සඳහා විවිධ වියදම්		9,873.00		9,873.00		
උපචිත කාර්ය මණ්ඩල දීමනා					2,800.00	
උපචිත ගණකාධිකාරී දීමනා					40,000.00	
උපචිත විදුලි ගාස්තු		2,624.87			196.68	
උපචිත ගමන් ගාස්තු		700.00		700.00	-	
ඉදිරි වර්ෂය සඳහා සහතික පිටපත් ගාස්තු		3,000.00		3,000.00	-	
ඉදිරි වර්ෂය සඳහා හැඳුනුම්පත් ගාස්තු ගාස්තු ලැබීම්		149,400.00			3,500.00	
ඉදිරි වර්ෂය සඳහා සම්මුඛ පරීක්ෂණ ගාස්තු		19,550.00			239,400.00	
ඉදිරි වර්ෂය සඳහා විශේෂ වෛද්‍ය මණ්ඩල ගාස්තු		28,000.00		21,200.00	-	

උපචිත අතිකාල වියදම්		13,383.96		13,383.96	-	
ඉදිරි වර්ෂය සඳහා තැපැල් ගාස්තු	350.00	-		200.00	-	
උපචිත සනීපාරක්ෂක සේවා ගාස්තු	-	-		-	23,447.60	
ඉදිරි වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තු	18,000.00	-		-	3,000.00	
වාහන ලාංඡන නිකුත් කිරීමේ ආදායම		6,000.00		-	6,000.00	
උපචිත ජල බිල්පත් ගාස්තු	913.00	-		-	913.00	
ඉදිරි වර්ෂය සඳහා ලිඛිත පරීක්ෂණ ගාස්තු		901,900.00		128,150.00	-	
	1,098,345.45	1,144,320.84	45,975.39	424,962.71	554,699.03	129,736.32
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය			418,625.73			3,739,543.04
<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය</u>						
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	-			-		
පාරිතෝෂික ආයෝජන පොළිය	-	212,736.04		-	229,357.98	
වාර්ෂික පාරිතෝෂික දීමනා ගාස්තු	118,030.00	-		274,510.00	-	
	118,030.00	212,736.04	94,706.04	274,510.00	229,357.98	(45,152.02)
මුදල් හා සමාන විෂයන්ගේ අඩුවීම			513,331.77			3,694,391.02
<u>මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය</u>						
කාර්ය මණ්ඩල ණය පොළිය			81,013.21			88,547.63
			594,344.98			3,782,938.65
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන විෂයන්						
බැංකු ගිණුම			2,523,065.07			3,117,410.05
			3,117,410.05			6,900,348.70
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන විෂයන්						
බැංකු ගිණුම			3,117,410.05			6,900,348.70
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන විෂයන්ගේ අඩුවීම			3,117,410.05			6,900,348.70

සකස් කළේ -
ප්‍රභාත් ගුණසේකර
මූල්‍ය සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

පරීක්ෂා කළේ -
ඒ.එම්.එම්.කේ.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ආයුර්වේද දෙපාර්තමේන්තුව

වෛද්‍ය ඒච්.බී.කේ.අජිත් කුමාර
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභාව

ආචාර්ය එම්.බී.ජේ.අබේගුණවර්ධන
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස්

ආයුර්වේද වෛද්‍ය සභාව
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

විස්තරය	ප්‍රාග්ධනය හා සංචිතය	පෙරවර්ෂ ගැලපුම් හිඟුම	සමුච්චිත ලාභය / අලාභය	මුළු ශුද්ධ ප්‍රාග්ධන හා සංචිත
2022.01.01 දිනට ඉදිරියට ගෙනගිය ශේෂය	2,305,196.48	-	3,871,273.93	6,176,470.41
				-
2022 සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස				-
				-
<u>කාලච්ඡේදය සඳහා වූ ශුද්ධ වත්කම්වල වෙනස්වීම</u>				-
පෙරවර්ෂ ගැලපීම මත වෙනස්වීම			(11,000.00)	(11,000.00)
කාලච්ඡේදය සඳහා හඳුනාගත් අතිරික්තය / ඌණතාවය			3,295,162.84	3,295,162.84
2022.12.31 දිනට ශේෂය	**2,305,196.48**	**-**	**7,155,436.77**	**9,460,633.25**

ඉහත සකස් කරන ලද හිඟුම්කරණ ප්‍රකාශනය රජයේ හිඟුම් කරන ප්‍රමිතයන්ට අනුව නිවැරදිව හා ඊට අදාල හිඟුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.

සකස් කළේ -
ප්‍රභාත් ගුණසේකර
මූල්‍ය සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

පරීක්ෂා කළේ -
ඒ.එම්.එම්.කේ.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ආයුර්වේද දෙපාර්තමේන්තුව

වෛද්‍ය ඒ.බී.කේ.අජිත් කුමාර
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභාව

ආචාර්ය එම්.බී.ඒ.අබේගුණවර්ධන
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } MED/A/AMC/FA/22/02 මෙහි අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 02 දින



සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව.

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත අංක 01 හි 21(ඉ) ඡේදය ප්‍රකාරව අතිරේක මූල්‍ය ප්‍රකාශනයක් වශයෙන් අයවැයගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා අතර සන්සන්දනයක් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැය ගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස හෝ ඉදිරිපත් කළ යුතු නමුත් අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත අංක 01 හි 28 ඡේදය ප්‍රකාරව සටහන්වළ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම යටතේ අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනයක් පැහැදිලිව නොසඟවා ඉදිරිපත් කළයුතු වුවත් අදාළ අනුකූලතා ප්‍රකාශනය පැහැදිලිව ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත අංක 01 හි 150 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කළයුතු අස්පීත්වයේ නිත්‍ය පිහිටීම, නෛතික ස්වභාවය, මෙහෙයුම් ස්වභාවය, ප්‍රධාන කටයුතුවල විස්තරයක් සහ මෙහෙයුම් පාලනය කිරීමට අදාල වන ව්‍යවස්ථා පිළිබඳ යොමු යනාදි තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත අංක 07 හි 50 ඡේදය ප්‍රකාරව අස්පීත්වයක මෙහෙයුම්වල එකම ස්වභාවයේ හා එකම භාවිතයෙන් යුත් වත්කම් කාණ්ඩ ලෙස එනම් පන්තියක් ලෙස හඳුනා ගෙන දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කළ යුතු වුවත්, පිරිවැය රු. 6,979,238 ක්වූ දේපල පිරියත උපකරණ, එලෙස පන්ති වශයෙන් හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සේවා අපේක්ෂකයන් විසින් සභාවේ බැංකු ගිණුමට සෘජුවම තැන්පත් කර තිබුණු රු. 23,300 ක් ආදායම් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) නව දුරකථන සම්බන්ධතාවයක් ලබා ගැනීමට දැරූ රු.17,015 ක ප්‍රාග්ධන වියදමක් සමාලෝචිත වර්ෂයේ අයහාර වියදමක් ලෙස ගිණුම්ගත කිරීමත්, ඉදිරි වර්ෂයට අදාළ රු. 11,100 ක අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශපත්‍ර ගාස්තුවක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු. 28,115 ක් වැඩියෙන් දැක්වුණි.

(උ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාවේ නිලධාරීන් 10 දෙනෙකු සඳහා වෙන් කළ යුතු පාරිතෝෂික දීමනා රු.293,715 ක් වුවත් එය රු.274,510 ක් ලෙස රු.19,205 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සහාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

(අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටස

(i) 11(1)(ඉ) වගන්තිය.

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වන කොටසේ (11)(i)(ඉ) වගන්තිය ප්‍රකාරව, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරාපත් කරගනු ලැබූ සාමාජිකයන් තිදෙනෙකු සභාවේ සාමාජිකයන් ලෙස පත්කළ යුතු නමුත් එම සාමාජිකයන් තිදෙනා පත්කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ii) 18(ඇ)හා(ඈ) වගන්ති

2022 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිව තිබුණු මුළු හෙද නිලධාරීන් සංඛ්‍යාව 39 ක් හා හෙසජ්ජකවරුන් සංඛ්‍යාව 260 ක් වූ අතර ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම සංඛ්‍යා යාවත්කාලීනවී නොතිබුණි. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට සුවිශේෂ වූ හෙද නිලධාරීන් බඳවා ගෙන පුහුණු කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම වෙනුවට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු පාසල් මගින් බටහිර වෛද්‍ය ක්‍රමවේද යටතේ පුහුණුව ලැබූ හෙද නිලධාරීන් 39 ක් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා යොදවා ගෙන තිබුණු බැවින් පනතේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකිව පැවැතුණි. ඉකුත් වර්ෂවල විගණන වර්තා මගින්ද මෙම අඩුපාඩුව පෙන්වා දී ඇතත් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(iii) 19(i)(අ) වගන්තිය

සභාව විසින් එම සභාවේ ලේකම් වශයෙන්ද කාර්ය මණ්ඩලයේ ප්‍රධාන නිලධාරියා වශයෙන්ද කටයුතු කළ යුතු ලේඛකාධිකාරීවරයෙකු පත්කළ යුතු වුවද, එම තනතුරට ස්ථිර පදනමින් ලේඛකාධිකාරිවරයකු පත්කිරීමට කටයුතු නොකර කෙටිකාලීනව කොන්ත්‍රාත් පදනමට සහ වැඩ බැලීමේ පදනමට අඛණ්ඩව බඳවාගැනීම් සිදුකර තිබුණු බැවින් සභාවේ පරිපාලන කටයුතු විධිමත්ව සිදු කිරීමට බාධාකාරී තත්ත්වයක් උද්ගතව පැවැති බව නිරීක්ෂණය විය.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය --- 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලසි 756 (5)	මුදල් වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර, මාර්තු 31 ට පෙර එම වාර්තාව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ)	2014 ඔක්තෝබර් 15 දිනැති අංක 1884/36 අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති	සෑම අවුරුදු 05 කට වරක් සෑම ආයුර්වේද වෛද්‍ය වෘත්තියෙකු විසින්ම තම ලියාපදිංචිය අලුත් කළ යුතු නමුත් ඒ සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචිය වර්ෂ 05 ක් ඉක්ම වූ වෛද්‍යවරු 18,516 ක් සිය ලියාපදිංචිය අලුත් කරගෙන නොතිබුණි. තවද, ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ සිය ලියාපදිංචිය අළුත් කළ යුතු වෛද්‍යවරුන් 430 දෙනෙකුට අදාළ අළුත් කිරීමේ ගාස්තු ප්‍රමාණය රු.795,600 ක් වන බවට සභාව විසින් ගණනය කර තිබුණු නමුත් එම ආදායමද එකතුකර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේද අනුගමනය කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව වෛද්‍ය සභාවේ බලතල, කර්තව්‍ය, සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව වෛද්‍ය සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරු සංඛ්‍යාව 26,650 ක් බවත්, මියගිය සංඛ්‍යාව 3,827 ක් බවත් වර්තා කර තිබුණු නමුත් මියගිය පාරම්පරික වෛද්‍යවරුන් පිළිබඳ නිවැරදි තොරතුරු යාවත්කාලීනව ලබාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද මියගිය වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අවලංගු කර ඒ බව මහජනතාවට නිවේදනය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් අදාළ ලියාපදිංචි සහතික අවභාවිතා කිරීමේ ඉඩ කඩ පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තීය විෂමාචාර සම්බන්ධයෙන්ද, ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන්ද ඉකුත් වර්ෂ 5 දී ලැබී තිබුණු පැමිණිලි 247 කින් පැමිණිලි 41 ක විමර්ශන කටයුතු 2023 මාර්තු 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව තිබුණු ක්‍රියාකාරකම් 08 කින් ක්‍රියාකාරකම් 02 ක් එනම් සියයට 25ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. තවද, ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව තිබුණු ක්‍රියාකාරකමක් වන සෑම වසර පහකට වරක් ලියාපදිංචිය අලුත් කළ යුතු වෛද්‍යවරුන්ට අදාල ආකෘති පත්‍ර යොමු කිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 30 ක් තරම් අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) ආයුර්වේද වෛද්‍යවරු, පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු, ආයුර්වේද භෙද නිලධාරීන් හා භෙසජ්ජකවරු ලියාපදිංචි කිරීම, ඔවුන් වෙනුවෙන් විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.

(ඉ) පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචිය අපේක්ෂිත අයදුම්කරුවන් පුහුණු කාලය තුළ ඇගයීම සඳහා සකස් කළ නිර්ණායක අනුව සිසුන් ලියාපදිංචි කිරීමේ කටයුතු 2022 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. ඉකුත් වර්ෂවල විගණන වර්තා මගින්ද මෙම අඩුපාඩුව පෙන්වා දී ඇතත් නව ක්‍රමවේදය කඩිනමින් ස්ථාපිත කිරීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඊ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. ඉකුත් වර්ෂවල විගණන වර්තා මගින්ද මෙම අඩුපාඩුව පෙන්වා දී ඇතත් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. චික්‍රමරත්න
විගණකාධිපති

සංස්ථාපිත තොරතුරු

නම - ආයුර්වේද වෛද්‍ය සභාව

ව්‍යවස්ථාපිත තත්වය -

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශය අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. 1935 අංක 46 දරන ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරන ස්වදේශීය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ නැවත ස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

බැංකුකරුවෝ -

1. ලංකා බැංකුව, (ප්‍රධාන බැංකුකරු)
   මහරගම

2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
   ඉතුරුම් නිවස,
   ප්‍රධාන කාර්යාලය,
   කොල්ලුපිටිය.

විගණකයින් -

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නො.306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.



ආයුර්වේද වෛද්‍ය සභාව
ஆயுர்வேத வைத்திய சபை
Ayurvedic Medical Council

"විවික වෙදකුරු මනුවෙනා නිරෝගී දැසයි ශ්‍රී ලංකා"

කාර්යාලය / அலுவலகம் / Office
Tel 011-284 4966
011-289 6911/12
Ext - 316
Fax 011-274 6754

සභාපති / தலைவர் / Chairman
Tel 011-284 7555
Fax 011-284 5537

ලේඛකාධිකාරී / பதிவாளர் / Registrar
Tel 011-284 4966
011-2896911/12
Ext - 201
Fax 011-274 6754

E- Mail : ayurmc@sltnet.lk
Web Site: www.amc.ayurveda.gov.lk

ස්තුතිය

ගරු සෞඛ්‍ය අමාත්‍ය,
ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මැතිතුමා (පා.ම.)

රාජ්‍ය අමාත්‍ය
නීතීඥ සිසිර ජයකොඩි මැතිතුමා (පා.ම.)

ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

අතිරේක ලේකම් (පාලන)
සෞඛ්‍ය අමාත්‍යාංශය - දේශීය වෛද්‍ය අංශය

ආයුර්වේද වෛද්‍ය සභාවේ සියලුම සාමාජික භවතුන්

ආයුර්වේද දෙපාර්තමේන්තුව

දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය

පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ

සියලුම පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන්

ජාතික විගණන කාර්යාලය

නීතිපති දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

තැපැල් දෙපාර්තමේන්තුව

සියලුම ජනමාධ්‍ය ආයතන

සියලුම දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල

සියලුම ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සහා

හා

ආයුර්වේද වෛද්‍ය සභා කාර්යය මණ්ඩලය